# 2.6 වෙළඳපොල ලිහිල්කරණයෙන් පසු කාන්තා දායකත්වයේ සිදු වී ඇති වෙනස

ප්‍රේමා පොඩිමැණිකේ [1]
ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## ABSTRACT

වෙළඳපොල ලිහිල්කරණය නැත්නම් විවෘත වෙළඳපොල සංකල්පය ශ්‍රී ලංකාව සමඟ කථාකරන්නට සිදුවන්නේ 1977 වසරේ සිටයි. 1977 ට පෙර පැවති සංවෘත ආර්ථික ක්‍රමය වෙනුවට ගලපාගන්නා ලද විවෘත ආර්ථික සංකල්පය තුළින් සංවර්ධන ඉලක්කයන් ජය ගැනීම මෙහදී මූලික පරමාර්ථය කරගන්නා ලදී. රජය හෝ රජය වෙනුවෙන් වෙනත් බල අධිකාරියක් ආර්ථික කටයුතු වලට මැදිහත් නොවී ආර්ථිකයක ක්‍රියාකාරී මෙවලම් වලට නිදහසේ හැසිරීමට ඉඩකඩ සැලසීමක් වෙළඳපල ලිහිල්කරණය තුළින් සිදුවේ. වර්තමානය වනවිට විවෘත වෙළඳපල සංකල්පය නැතිනම් වෙළඳපල ලිහිල්කරණය යන්න ඉතාමත් පුළුල් දැක්මක් ඔස්සේ ජාත්‍යන්තරකරණය දක්වාම ව්‍යාප්තව තිබෙන බව පැහැදිලිය. 1977 ආර්ථික ලිහිල්කරණයෙන් පසු විදේශීය සේවා නියුක්තියේද කාන්තා සහභාගිත්වය වර්ධනය වී තිබේ. එහි ප්‍රතිපල වශයෙන් පුරුෂ පක්ෂය ඉක්මවූ අධි ස්ත්‍රී දායකත්වයක් විගමනික ක්‍රියාවලියේදී දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ ස්ත්‍රී සේවා නියුක්තිය සළකන විට ඇඟළුම් කර්මාන්ත අංශයට ඉහළ වැදගත් කමක් ලැබේ. අද ඇඟළුම් කර්මාන්තයේ  යෙදී සිටින ශ්‍රමිකයින් අතරින් 80 % ක්ම කාන්තාවන් වේ. ආර්ථික ලිහිල්කරණයෙන් පසුව මෙම ප්‍රවණතාවයද දිනෙන් දින වර්ධනය වී තිබේ.

ආර්ථික ලිහිල්කරණයෙන් පසු පසුගිය දශක කීපය තුළ ශ්‍රී ලංකාවේ කාන්තාව පෙර නොදැරූ වගකීම් සහිත තනතුරු වලට පත් වී සිටී. විවිධ දෙපාර්තමේන්තු වල අධ්‍යක්ෂක තනතුරු, බැංකුවල සාමාන්‍යාධිකාරී තනතුරු, උසාවිවල විනිශ්චයකාරවරියන්, පොලිසියේ අධිකාරිවරියන් වශයෙන් ඔවුන් පත්වීම් ලැබ තිබේ. එසේම විධිමත් දේශපාලනයේ අද කාන්තාව නිරතව සිටි විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල ආචාර්ය, මහාචාර්ය පදවි වලට කාන්තාවන් විශාල වශයෙන් අනුයුක්තව සිටිති. එසේම සංස්කෘතික සීමාවලින් ඔබ්බට ගොස් කාන්තා රැකියා ක්ෂේත්‍රය පුළුල් වීමේ ප්‍රවණතාත්වක්ද දක්නට ලැබේ. කාන්තා රියදුරුවරියන්, කොන්දොස්තර වරියන්, සුපවයිසර් වරියන්, අලෙවි සහායිකාවන් වැනි තනතුරු බිහිවීම එහි ප්‍රතිඵලයකි.

සාමය සඳහා කාන්තාවන්ගේ ඉදිරියට ඒමක් ද ආර්ථික ලිහිල්කරණයෙන් පසු දක්නට ලැබේ. සාමය සඳහා කාන්තාවෝ, වැනි කාන්තා සංවිධාන වර්තමානයේ බිහිවී ඇත්තේ ඒ අනුවයි. ජාත්‍යන්තර වශයෙන් සැලකූ විට ජාත්‍යන්තර කාන්තා දිනයක්, කාන්තා දශකයක් සහ 1975 සිට කාන්තා වර් ෂයක් ප්‍රකාශයට පත්කර තිබෙන අතර  කාන්තාවන් වෙනුවෙන්  විවිධාකාරයේ වැඩපිළිවෙල් දියත් කොට තිබේ. ආර්ථික ලිහිල්කරණයෙන් පසු කාන්තාවගේ සක්‍රීය දායකත්වයක් සෑම ක්ෂේත්‍රයක් තුළම විද්‍යාමාන වේ.

**Key words**: වෙළඳපොල ලිහිල්කරණය, කාන්තා දායකත්වය